# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2014 අංක 43 දරන සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 නොවැම්බර් මස 24 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 නොවැම්බර් මස 28 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 11.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 50.00 යි.**

# 2014 අංක 43 දරන සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2014 නොවැම්බර් මස 24 වන දින]

එල්. ඩී.—ඕ.(අයි.එන්.සී.) 33/2013

## සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලීමක් කර ඇති බැවින් ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2014 අංක 43 දරන සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනමේ" දැනට සාමාජිකයන් වශයෙන් සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයින් වශයෙන් මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද නඩු පැවරිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට තිබිය යුතු ය. සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම සංස්ථාගත කිරීම.

2—PL 007413—2150 (2014/10)

(2) සංස්ථාව, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ ඒ හා සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) අම්පාර, නවගම්පුර, පිහිටි ‘‘සිව්මුනි සෑ වෙහෙර’’ බෞද්ධ මධ්‍යස්ථානයේ ආගමික කටයුතු පවත්වා ගෙන යාම;

(ආ) දැහැමි සහ ආගමික සමාජයක් සහතික කිරීම සඳහා බෞද්ධාගමේ අනුගාමිකයන් හැඩගැස්වීම;

(ඇ) (i) බෞද්ධාගමට අදාළ පූජනීය ස්ථාන සහ ඓතිහාසික ස්මාරක ආරක්ෂා කිරීමට ; සහ

(ii) බෞද්ධාගමේ අනුගාමිකයන් හට ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම පිළිබඳ දැනුම ලබා දීමට

අදාළ ආයතන වෙත, එම ආයතනවල එකඟතාව මත සහාය වීම.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කටයුතු සමග ගැටුම් ඇති නොවන බවට සංස්ථාව සහතික විය යුතු බව.

**4.** ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්යය අතර, කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) මේ පනතේ විධිවිධානවලට යටත් ව සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ධුර

දරන්නන් යම් සංඛ්‍යාවකගෙන් සමන්විත වන (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන) විධායක කමිටුවක් විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) (අ) මෙම පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරනු ලැබූ පදනමේ විධායක කමිටුව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම කමිටුව පත් කරනු ලබන තෙක් හෝ තෝරාගනු ලබන තෙක් සංස්ථාවේ කමිටුව වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) සංස්ථාවේ ප්‍රථම කමිටුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වී වසර එකක කාලයක් ඇතුළත පත් කිරීම හෝ තෝරා ගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ඇතුළුව කමිටුවේ සෑම ධුර දරන්නෙකුම වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලැබීම හෝ තෝරගැනීම කළ යුතු අතර, එම වසර තුනක කාලය අවසන් වීමෙන් පසුව එම නිලධරයා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත් කිරීම හෝ තෝරා ගැනීම සඳහා යෝග්‍ය වන්නේය.

(ආ) යම් ධුර දරන්නකු මියයාම, ඉල්ලා අස්වීම, නොහැකියාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුරය පුරප්පාඩු වන අවස්ථාවක දී කමිටුව විසින් සංස්ථාවේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරාගැනීම හෝ පත්කිරීම කරනු ලැබිය යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරාගත් හෝ පත් කරනු ලැබූ තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුර දැරිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය හෝ යෝග්‍ය වන කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කාරණා සහ දේවල් කිරීමට, ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම,

ඉදිකිරීම් සිදු කිරීම, අළුත්වැඩියා කිරීම සහ වෙනත් යම් ආකාරයකින් අත්පත් කර ගැනීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීමේ අරමුණ ඇතිව එම දේපල සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ ඒවා බැහැර කිරීම ;

(ආ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම සහ රැස්කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම :

එසේ වුවද, සංස්ථාවට ලැබෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් කමිටුව විසින් මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතු ය.

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළහැකි සාධන පත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් ලබා දීම, පිටසන් කිරීම, ගණුදෙනු කිරීම, මිල දී ගැනීම, විකිණීම, සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම ;

(ඈ) කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට සංස්ථාවේ අරමුණු සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් ආයෝජනය කිරීම ;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව කිසියම් නීත්‍යානුකූල භාරයක් හෝ නිශ්චල හෝ පෞද්ගලික දේපලක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම ;

(ඊ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, සේවයෙන් පහ කිරීම, සේවය අවසන් කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන ආකාරයට ඔවුන් සඳහා වැටුප්, දිරි දීමනා සහ පාරිතෝෂික ගෙවීම ;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම.

(ඌෟ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය විදේශීය ආයතන සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම ;

(එ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ දී හෝ විදේශයන්හි දී සේවක පිරිස් පුහුණු කිරීම ; සහ

(ඒ) සංස්ථාවේ අරමුණු නිසි පරිදි හා ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය වන හෝ උපයෝගී වන වෙනත් සියලු දේ කිරීම ;

7. (1) සංස්ථාව විසින් යම් මහ සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන වූ රීති, පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල විය යුතු ය. සංස්ථාවේ රීති.

(අ) සාමාජිකත්වය වර්ගීකරණය කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු ;

(ආ) කමිටුවේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම,ඔවුන්ගේ ධුරය හිස් කිරීම, ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත්කිරීමේ, නියම සහ කොන්දේසි බලතල, කාර්ය හා කර්තව්‍ය ;

(ඈ) කමිටුවේ හෝ එහි යම් අනු කමිටුවක රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී කටයුතු පවත්වාගෙන යාම ;

(ඉ) සංස්ථාවේ හා කමිටුවේ සාමාජිකයකු බවට පත්වීමට අවශ්‍ය සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපල, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ; සහ

(උ) පොදුවේ සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ එහි අරමුණු සාක්ෂාත් කරගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකිය.

(3) (1) වන වගන්තිය යටතේ සාදන ලද රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය. ;

(4) සංස්ථාවේ සාමාජිකයන් සෑම කල්හිම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සාමාජිකයන්ගේ සාමාජික නාම ලේඛනය.

**8.** සාමාජිකයන්ගේ නම්, ලිපින සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජිකයන්ගේ ලේඛනයක් කමිටුව විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබුණු සියලුම මුදල්, කමිටුව විසින් අනුමත කරන ලද එක් බැංකුවක හෝ බැංකු වැඩි ප්‍රමාණයක තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මෙම පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ හා ඉටු කිරීමේ දී, සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

10. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කළ යුතු ය.

(4) මේ වගන්තියේ ‘සුදුසුකම් ලත් විගණකවරයා’ යන්නෙන් :—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද; එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි ගණකාධිකාරී සමාගමක්, හෝ

අදහස් වේ.

11. (1) කමිටුව විසින් සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය ද සමග ඒ වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ මාස හයක කාලයක් ඉකුත් වීමට පෙරාතුව 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. වාර්ෂික වාර්තාව.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාව වෙත ලැබුනු විදේශී සහ දේශීය මුදල්වලට අදාළ වෙනම ගිණුම් වාර්තාවක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග යැවිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනම විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමවෙත අයවිය යුතු සියලු ණය සහ පදනම වෙත ගෙවිය යුතු සියලු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපල දැරීම.

**13.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල යම් දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර එවැනි සියලු දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපල දැරිය යුතු ය.

මුදල් සහ දේපල අදාළ කර ගැනීම.

**14.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාවේ මුදල් හා දේපල මෙහි සඳහන් පරමාර්ථ ඉටුකර ගැනීම උදෙසා පමණක් අදාළ කරගත යුතු අතර, එහි යම් කොටසක් ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් ඍජුවම හෝ වක්‍රව සංස්ථාවේ සාමාජිකයන් වෙත ගෙවීම හෝ පැවරීම නොකළ යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**15.** (1) සංස්ථාවේ මුද්‍රාව කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එම සාමාජිකයන් විසින් ඔවුන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එම සාධන පත්‍රයෙහි ඔවුන්ගේ නම් අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවෙකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව, කමිටුව විසින් තීරණය කරනු ලබන කමිටුවේ යම් ධුර දරන්නෙකුගේ භාරයේ තැබිය යුතු ය.

**16.** (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපලක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

(2) (1) උපවගන්තියේ කාර්ය සඳහා සුදුසු ආයතනය සංස්ථාව විසුරුවා හැරීමට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

**17.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**18.** මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.